# මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු වාර්තාව

## 2018 ජනවාරි මාසය

## තබ්බෝව මහා වාරිමාර්ග ව්‍යාපාරය

15 JAN 2018
M01

පැවැත්වූ දිනය - 2018.01.04

වේලාව - පෙ.ව.9.30

ස්ථානය - නේවාසික ව්‍යාපෘති කලමනාකරණ කාර්යාලය , කරුවලගස්වැව

**සහභාගී වූ රාජ්‍ය නිළධාරීන්**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එල්.පුබුදු නිහාල් ශාන්ත | නේ.ව්‍යා.කළමනාකරු |
| 02 | එස්.එම්.එන්.සුහසිංහ | සංවර්ධන නිළධාරි |
| 03 | ඩී.එස්. හෙට්ටිආරච්චි | වාරිමාර්ග ඉංජිනේරු |
| 04 | එච්. වයි.එස්. ද සොයිසා | වනජීවී නියාමක |
| 05 | එම්.එම්.එම්.වසීම් | ඉං.සහකාර |
| 06 | එච්.එම්.මෙත්තා සුරංගනී | ගො.සං.ප්‍රා.නි |
| 07 | ටී.එම්.පී.ජ්. තෙන්නකෝන් | ගො.සං.ප්‍රා.නි. |
| 08 | ඩී.එස්.ඩබ්.පී.ගුණතිලක | කෘෂි.උපදේශක |
| 09 | එච්.එම්.එන්.ඊ.හේරත් | කෘෂි.උපදේශක |
| 10 | කේ.එන්.එස්.කුමුදුනි | කෘ.ප.නි.ස |
| 11 | එම්. අනුලා කරුණාතිලක | කෘ.ප.නි.ස |
| 12 | එම්.පී.ඩී.අනෝමා ආරියපාල | කෘ.ප.නි.ස |
| 13 | ජී.එච්.එම්.කීර්ති විජේසිරි | කෘ.ප.නි.ස |
| 14 | ඩබ්.ඒ.පියසිරි | ජල පාලක |
| 15 | එම්.ටී.එම්.කලීල් | කෘ.ප.නි.ස |

**සහභාගී වූ ගොවි සංවිධාන නියෝජිතයින්**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | කේ.ඒ.සිරිවර්ධන | සභාපති,වම් ඉවුර |
| 02 | එච්.එම්.අනුර කුමාර | උපදේශක,වම් ඉවුර |
| 03 | ඩබ්.එස්.ඩී.කුමාර පෙරේරා | ලේකම්,වම් ඉවුර |
| 04 | සී.ආර්.එම්.ආර්.දිසානායක | භාණ්ඩාගාරික, පළුදාගම |
| 05 | එස්.ඒ.අයිරාංගනී | ලේකම්,පළුදාගම |
| 06 | ඩබ්.සී.ආර්.පෙරේරා | උප සභාපති,තේවනුවර |
| 07 | ආර්.එම්.සම්පත් චන්දන | සභාපති,පැරකුම් |
| 08 | ජේ.ඒ.පියතිලක | උප සභාපති |
| 09 | ඒ.එස්.ජයතිලක | උප සභාපති |
| 10 | ජේ.ඒ.පද්මිණි රූපලතා | භාණ්ඩාගාරික,එගොඩපිටිය |
| 11 | එම්.එම්.ජයතිලක | භාණ්ඩාගාරික |
| 12 | සී.අනුර පාලිත | ලේකම්,මයිලන්කුලම |
| 13 | ඩබ්.දයාරත්න | සභාපති,මයිලන්කුලම |
| 14 | ජේ.එම්.සුනිමල් රත්නසිරි | භාණ්ඩාගාරික ,මයිලන්කුලම |
| 15 | එම්.ඩී.හැරිසන් | සභාපති |
| 16 | ඒ.එම්.ජී.සුරංග | සභාපති,ප්‍රදීපාගම |
| 17. | කේ.හරිස්චන්ද්‍ර | සභාපති,තේවනුවර |

**පසුගිය කමිටු වාර්තාවේ තීරණ ක්‍රියාත්මක කිරීම**

- ➢ අදාල අංශ වෙත යොමු කිරීමට යෝජනා කරගත් තීරණ සියල්ල දැනුවත් කර ඇති බව - නේවාසික ව්‍යාපාර කළමනාකරු
- ➢ ක්ෂේත්‍ර පරික්ෂාවන් සඳහා යෝජනා කරගත් ස්ථාන පරික්ෂා කල බව - ඉංජිනේරු සහකාර

**පසුගිය වාර්තාවේ යෝජනා ස්ථිර කිරීම**

- ➢ යෝජනා කිරීම - පුදිපාගම ගරු සභාපති
- ➢ ස්ථිර කිරීම - වම් ඉවුර ගරු භාණ්ඩාගාරික

**ආයතන සංවර්ධන- එස්.එම්.එන්.සුහසිංහ මහතා (සංවර්ධන නිළධාරී)**

| කාරණය | ඉලක්කය | ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|---|
| මහ සභා පැවැත්වීම | 12 | 09 | වගා කන්නය ප්‍රමාද වන බැවින් ප්‍රමාද වී මහ සභා පැවැත්වීමට තීරණය කර ඇති බව |
| කාරක සභා | 06 | 05 | ගොවීන් දහවල් කාලයේ ක්ෂේත්‍රයේ නොමැති හෙයින් රාත්‍රී කාලයේ (සවස 6.00න් පසු) කාරක සභා පවත්වනු ඇත. |
| ගොවි සංවිධාන ගිණුම් පොත් විගණනය | 06 | 05 | පුදිපාගම 2018 ජනවාරි මස විගණන වාර්තාව ලබා ගැනිමට හැකියාව ඇත |
| මාසික මුදල් සාරාංශ සකස් කිරීම | 06 | 06 | දැනට මාසිකව සකස් කිරීම් කරනු ලබයි. |
| සාමාජික නාම ලේඛන යාවත්කාලීන කිරීම | 06 | 04 | දැනට සිදුකරමින් පවතී. |
| ඒකාබද්ධ ගොවි සංවිධාන සක්‍රීය කිරීම | 01 | 01 | ජුනි මස පිහිටුවා ඇත. |
| නිරන්තර නඩත්තු වැඩ හදුනා ගැනීම | 06 | 06 | 2018 වර්ෂයට අදාලව PEISEIP ව්‍යාපෘතිය යටතේ තොරතුරු ලබා ගැනිම සිදු කරනු ලබයි. |

- ➢ යොදාගත් පරිදි දිනයේ පහසු වේලාවක කාරක සභාව පවත්වන ලෙසත්
- ➢ ගිණුම් පොත්වල සියලු අඩුපාඩු සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්
- ➢ සාමාජික නාම ලේඛන,නඩත්තු ලේඛන පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් දැන්විය
- ➢ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන ලෙස නිරන්තර නඩත්තු වැඩ හදුනාගනිමින් තම සැලසුම් සකස්කරන ලෙස දැන්විය.
- ➢ රාජ්‍ය නිලධාරීන් සියලු දෙනා සහභාගි වන හෙයින් ගොවි නියෝජිතයන් සියලු දෙනා කමිටුවට සහභාගී කරන මෙන් දැන්විය.
- ➢ පෙබරවාරි මස අවසන් වීමට පෙර 2017 වර්ෂයට අදාළව විගණන කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලෙස
- ➢ ගොවි සංවිධාන නිලවරණ කටයුතු ජුනි-ජූලි මස පැවැත්වීමට කටයුතු කරන ලෙස දැන්විය.

# වාරිමාර්ග ඉංජිනේරු - ඩී.සී. හෙට්ටි ආරච්චි මහතා

| ඉදිරිපත් කළ අය | කාරණය | විසඳුම | වගකීම |
|---|---|---|---|
| හෙට්ටි ආරච්චි මහතා | ඉදිරියේදී දැදුරු ඔය ජලාශය හරහා ජලය ඉගිනිමිටියට හා තබ්බෝව ජලාශය වෙත ලබා ගැනිමට වැඩි හැකියාවක් ඇතිබව. | දැදුරු ඔය ජලාශයේ දකුණු ඇළ මාර්ගය ඔස්සේ ඉගිනිමිටිය ජලාශයට ජලය ලබා ගැනිමෙන් පසු තබ්බෝව ජලාශයට යම් ජල ප්‍රමාණයක් ලබා ගැනිමට ඉදිරියේදි හැකියාව ඇති බව. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | ගොවි සංවිධාන සදහා කොන්ත්‍රාත් ලබා දිම. | චක්‍රලේඛ අනුව ඉදිරියේදි ගොවි සංවිධාන සදහා ප්‍රමුඛතාවය ලබා දිම. | |
| | PEISEIP ව්‍යාපෘතිය සදහා අදාළ නඩත්තු කටයුතු වල මුලික තොරතුරු ගොවි සංවිධාන කෙත් ඇළ මට්ටමින් ලබා ගැනිම. | ඉදිරියේදි ගොවි සංවිධාන මට්ටමින් ගොවින් දැනුවත් කර කෙත් ඇළ මට්ටමින් අවශ්‍ය නඩත්තු ලේඛන සකස් කිරිම සිදු කරනු ලබයි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| ප්‍රදිපාගම හා පළදාගම ගොවි සංවිධාන | D1 ප්‍රධාන ඇළේ LB8 ඇළේ සාදා ඇති කොන්ක්‍රීට් වේල්ල සදහා පාලමක් සාදා ගැනිම | පාලම් 08 ක් සදහා දැනට ඇස්තමේන්තු කර ඇති අතර වම් ඉවුර සදහා 03 ක් හා දකුණු ඉවුරට 05 ක් වශයෙන් වැඩ සිදු කරනු ලබයි.හැකි පරිදි මයිලන්කුලම සදහා පාලම් 02 ලබා දිමට කටයුතු කරයි. | |
| වම් ඉවුර | තබ්බෝව ව්‍යාපාරය හරහා කාපට් පාර සෑදිම සදහා සිදු කළ සංවර්ධන කටයුත්තේදි ඇළ කන්ද කපා ඉවත්කිරිම සිදු කර ඇති බැවින් එම කොටස යථා පරිදි සෑදිය යුතු බව එසේ නොවුනහොත් ජලය මාර්ගය හරහා පිටවිම සිදු වන බව. | I-ROAD ව්‍යාපෘතියේ අදාළ නිලධාරින් සමග සාකච්ඡා කර අවශ්‍ය කටයුතු<br>සොයා බලා පියවර කඩිනමින් ගැනිම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | පාර සෑදිමේදි පළදාගම D -02 ඇළ බොරළු දමා වසා දමා ඇත.එය කඩිනමින් ඉවත් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව. | I-ROAD ව්‍යාපෘතියේ අදාළ නිලධාරින් සමග සාකච්ඡා කර අවශ්‍ය කටයුතු<br>සොයා බලා පියවර කඩිනමින් ගැනිම | |
| පැරකුම් හා ප්‍රදිපාගම | තබ්බෝව ව්‍යාපාරයට ලබා දෙන නඩත්තු නිවැරදි ක්‍රමවේදයක් තුලින් සාධාරණව ගොවි සංවිධාන 06 සදහාම ලබා දිමට කටයුතු කල යුතු බව | නඩත්තු ප්‍රමුඛතාවය මත කටයුතු සිදු කරන බවත් ඉදිරියේදි සෑම ගොවි සංවිධානයකටම නඩත්තු ප්‍රමුඛතා ලේඛන අනුව වැඩ කටයුතු සිදු කිරිම. | |

| | | | |
|---|---|---|---|
| පැරකුම් හා ප්‍රදීපාගම | ප්‍රධාන ඇළ සුද්ධ පවිත්‍ර කිරීම පිළිබඳව ගොවි නිළධාරින් දැනුවත් නොකිරීම හා එය නිසියාකාරව සුද්ධ නොකිරීම. | ඉදිරියේදී දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම | |
| | දැදුරු ඔය ජලාශය මගින් ඉඟිනිමිටිය ජලාශයට ජලය ලබා දෙන බැවින් එයින් සාධාරණ ජල ප්‍රමාණයක් තබ්බෝව ජලාශයට ලබා දෙන ලෙස ඉල්ලා සිටීම. | අදාළ අංශ සමඟ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීම | |
| ප්‍රදීපාගම ගොවි සංවිධානය | ගල් ඇළෙහි දැනට බෝවී පවතින ජපන් ජබර කඩිනමින් ඉවත් කිරීමට කටයුතු සිදු කල යුතු බව | අවශ්‍යතාවය බලා ඉදිරියේදී කටයුතු සිදු කිරීම | |
| | ගල් ඇළෙහි දැනට පවතින ජලය අපතේ යෑම වලක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව. | ඒ සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීම.ගල් ඇළට අදාල ඇළ මාර්ගය අසල පස් කණ්ඩියක් දමා තාවකාලිකව ජලය පිටවීම වැළැක්වීමට පියවර ගැනීම හා හදිසි අවස්ථාවකදී ගොවි සංවිධාන නිළධාරින් පස් බැම්ම ඉවත් කිරීම සඳහා පියවර ගත යුතු බව. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | ගොවි සංවිධානය නඩත්තු වැඩසටහන් JCB යන්ත්‍රය ලබා ගැනීම | ප්‍රමුඛතාවය මත තබ්බෝව ගොවි සංවිධාන සඳහා JCB යන්ත්‍රය ලබා දීමට කටයුතු කරනු ලබයි. | |
| | එළාරිස් වැවේ වාන් ජලය පිටවීම සඳහා නිසි ඇළ මාර්ගයක් නොමැතිවීමත් කුඹුරු ඉඩම්,ගොඩ ඉඩම් හා නිවාස හානි වීමේ අවධානම ඇතිව පැවතීම. | මේ කඩිනමින් සිදු කළ යුතු කටයුත්තක් බවත් දැනට ප්‍රමුඛතාවය මේ සඳහා ලබා දී ඇති බවත්,නමුත් මුදල් ගැටලු මත මෙය ඇන හිට ඇත.ගොවි සංවිධානයේ දායකත්වය මත සිදු කිරීමට හැකි නම් අවශ්‍ය සහය කඩිනමින් ලබා දිය හැකි බව. | ගොවිජන.සං. දෙපාර්තමේන්තුව, කෘෂි උපදේශක වනාතවිල්ලුව |
| මයිලන්කුලම ගොවි සංවිධානය | අලින් ගම වැදීම නිසා තම බව භෝග විනාශවීම හා ජීවිත තර්ජන උග්‍ර අතට පත්වීම.<br>මුරියන්කුලම පාර හරහා අලි වැට නොමැති වීම. | දැනට අවශ්‍ය අලි වෙඩි ලබා දීමට කටයුතු කිරීම ඉදිරියේදී ගම් වදින කපොළු ආවරණය වන පරිදි මුර කුටි ලබා ගැනීම සඳහා ඉල්ලීම් කිරීම හා ඉහළ නිළධාරින් දැනුවත් කිරීම. | නෝ.ව්‍යා. කළමනාකරු, වනජීවී දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| පළදාගම ගොවි සංවිධානය | D1, D2, D3 ඇළ බැම්ම කැඩී ඇති බැවින් මාස්කන්නයට පෙර ප්‍රතිසංස්කරණය කිරිම සිදුකල යුතු බව. | JCB යන්ත්‍රය ලබා දී අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට පියවර ගැනීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | රදෙව් බැදි ඇළ ගස් වැවී අවහිර වී ඇති අතර එම ශාක කඩිනමින් ඉවත් කිරිමට කටයුතු සිදු කළ යුතු බව | අවශ්‍යතාවය බලා කටයුතු සිදු කිරිමට පියවර ගැනිම | |
| | කොන්ත්‍රාත් රැදෙවුම් මුදල් ලබා ගැනිමට නොහැකි විම. | එම කටයුතු සොයා බලා කඩිනමින් අවශ්‍ය තොරතුරු ලබා දිම සිදු කරනු ලබයි. | |
| නේ.ව්‍යා. කළමනාකරු | තබ්බෝව වැවේ රොන්මඩ ඉවත් කිරිමෙ නිරික්ෂණය කටයුතු වල යෙදුනු ගොවි මහතුන් හට එකඟ වූ අදාළ මුදල් කඩිනමින් ලබා දිමට කටයුතු කරන ලෙස. | දැනට වැවේ සිදු කරන පස් ඉවත් කිරිම් කටයුතු අනිකුත් දෙපාර්තමේන්තුවල නිර්දේශ හා අවසරයන් ලබා ගැනිමේ ප්‍රමාදයන් මත ඇන හිට ඇත. දැනට ගොවි සංවිධානය විසින් පස් බෙදා හැරීම සදහා කියුබ් 5000 කට අත්සන් තබා ඇත. ඉදිරියේදි අනෙකුත් ඉතිරි පස් ඉවත් කිරිම සදහා අත්සන් තැබිමේ දි අදාළ මුදල් ලබා ගෙන සිදු කරනු ලබයි.එය ගොවි සංවිධාන හය වෙතම ලබා දිමට කටයුතු සිදු කරයි. | පැරකුම් ගොවි සං.සභාපති |

<u>වෙනත්-නේවාසික ව්‍යාපෘති කළමනාකරු</u>

| ඉදිරිපත් කළ අය | කාරණය | විසදුම් | වගකීම |
|---|---|---|---|
| නේ.ව්‍යා. කළමනාකරු | PEISEIP ව්‍යාපෘතිය පිළිබඳව ගොවින් දැනුවත් කර මූලික තොරතුරු ලබා ගැනිම සදහා ගොවි සංවිධාන මට්ටමින් මහ සභා පැවැත්විමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව. | මහ සභා පැවැත්විම හා මූලික තොරතුරු කෙත් ඇළ මට්ටමින් ලබා ගැනිමට පහත සදහන් දිනවලදි ගොවි සංවිධාන මට්ටමින් පැවැත්වේ.<br>වම් ඉවුර,පළදාගම- ජන:12<br>ප්‍රදිපාගම,මයිලන්කුලම-ජන:11<br>පැරකුම්,තේවනුවර-ජන:16 | නේ.ව්‍යා. කළමනාකරු, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවි සංවිධාන නිලධාරින් |
| | ප්‍රධාන වැවේ බෝවි ඇති කිරියා ගස් ඉවත් කිරිම. | දිසාපතිතුමා දැනුවත් කර නියං ආධාර මත හා ශ්‍රමදාන මට්ටමින් අවශ්‍ය කටයුතු සිදුකිරිම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව ,නේ.ව්‍යා. කළමනාකරු |

| | | | |
|---|---|---|---|
| ජේ.ව්‍යා. කළමනාකරු | රදෙව් බැදි ඇළෙන් ජලය ලබා ගැනිම. | දැනට පවතින ගැටලුකාරි තත්වයට බලපෑ කරුණු සොයා බලා ඉදිරියේදි ගැටලුකාරි තත්වයක් ඇති නොවිමට පහත සදහන් ක්‍රියාමාර්ග ගැනිම.<br>➢ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂනය යටතේ අදාළ ඉදිකිරිම් හා ජලය ලබා ගැනිම සිදු කිරිම.<br>➢ පෙර ව්‍යාපාර කමිටුවේදි ගන්නා ලද තිරණ අනුව පරණ පයිප්පය ඉවත් කිරිම.<br>➢ ජලය ලබා ගැනිම සදහා ඇළ හරස් කිරිම සපුරා තහනම් බව.<br>➢ ඒකමතිකව ගන්නා ලද තීන්දු තිරණ අනුව ඉදිරියේදි කටයුතු සිදු කිරිම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

## ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිළධාරි

| ඉදිරිපත් කල අය | කාරණය | විසදුම | වගකීම |
|---|---|---|---|
| ගො .සං. ප්‍රා නිලධාරි වනාතවිල්ලුව | වගාවන් සදහා ණය පහසුකම් ලබා දිම. | ගො.සේවා පනතට අනුව අදාළ සේවාවන් ගොවින් වෙත ලබා දිම ඊට අමතරව ගොවිජන බැංකුව හරහා ගොවි ජනතාව වෙත ණය පහසුකම් ලබා ගැනිමට හැකිවිමත් ගොවින්ටත් ගොවි සංවිධාන මට්ටමිනුත් අදාළ බැංකු කටයුතු ගොවිජන බැංකුව හරහා සිදු කළ හැකි බවත් ඒ සදහා තරඟකාරි රාජ්‍ය බැංකු පොලි අනුපාතිකයන් ලබා දිමට හැකි බවත් ඕනෑම අවස්ථාවකදි අවශ්‍යතාවය මත මුදල් ආපසු ලබා ගැනිමට හැකියාව ඇති බව | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| | පොහොර සහනාධාර ලබා දිම | පොහොර සහනාධාර ලබා දිමේදි අදාල ගොවියා වෙත නියමිත ලියා පදිංචි අංකයක් ලබා දි ඇති අතර ඒ අනුව ඉදිරියේදි නිවැරදිව අදාළ පොහොර සහනාධාරය ලබා දිමට කටයුතු කරනු ලබයි. | |

| | | | |
|---|---|---|---|
| ගො .සං.ප්‍රා නිලධාරි වනාතවිල්ලුව | වගාවන් රක්ෂණය කිරිම. | දැනට කෘෂි රක්ෂණ යටතේ වගාවන් අක්කරයකට රු.675.00 මුදලකට රක්ෂණය කළ හැක.වගාව විනාශ විමේ දි රු.40,000.00 ක රක්ෂණ මුදලක් ගෙවනු ලබයි.(වල් අලි,නියඟය හා ගංවතුර හානි) රෝග මගින් බෝග විනාශ විම 5%ක අමතර ගාස්තුවක් මත රක්ෂණය විය හැක. | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| ගො.සං.ප්‍රා නිලධාරි ,කබ්බෝව | පලතුරු ගම්මාන ඇති කිරිම | පලතුරු ගම්මාන වැඩසටහන යටතේ සියලු ග්‍රාමසේවා වසම් වල පලතුරු වගා ව්‍යාපෘතියක් සිදු කරනු ලබයි.<br>පළදාගම- පැණි දොඩම්<br>මුරුක්කුවටවන -අනෝදා<br>ග්‍රාම සේවා වසමක් සදහා විසි දෙනෙකු සදහා පැළ ලබා දිමට කටයුතු කිරිම | |
| ගො.සං.ප්‍රා නිලධාරි ,කබ්බෝව | එගොඩපිටිය ඇතුළු සුළු වාරි 05 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරිම. | රදෙවි බැදි ඇළේ ජලය ලබා පෝෂණය වන එගොඩපිටිය වැව ඇතුළු අනෙකුත් සුළු වාරි පද්ධති 05 ක් වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කටයුතු සදහා ලබා දිම ඉදිරියේ දි අවධානය යොමු කර ඇති බව. | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| | බීජ ලබා දිම. | ජනාධිපති ලේකම් කාර්යාලය මගින් බීජ ලබා ගැනිමට කටයුතු කර අමතිර ජල මුලාශ්‍ර මගින් වගාවන් සිදු කරන ගොවින් සදහා ලබා දිමට කටයුතු සිදු කරයි. දේශිය බඩඉරිඟු අක්:03<br>හයිබ්‍රිඩ් බඩඉරිඟු අක්:07<br>රටකජු අක්:38<br>මිරිස් අක්:08 | |
| | අක්කර බදු අය කිරිම | අක්කරයක් සදහා රු.40.00 ක අක්කර බදු මාර්තු 31 දක්වා කාලය තුළ අය කරනු ලබයි.ඒ සදහා කෘ.ප.නි.ස මහත්ම මහත්මින් වෙත සහයෝගය ලබා දිය යුතු බව. | |

## කෘෂිකර්ම උපදේශක

| ඉදිරිපත් කළ අය | කාරණය | විසදුම | වගකීම |
|---|---|---|---|
| සුබෝධ මහතා | බිත්තර වි නිෂ්පාදනය | මි ඔයෙන් ජලය ලබා ගෙන දැනට කුඹුරු අක්කර 10 ක් බිත්තර වි සදහා වගා කරනු ලබයි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| සුබෝධ මහතා | UNDB වැඩසටහන යටතේ කලාපයේ ද්‍රෝණි සංවර්ධනය කිරීම | මෙම වැඩසටහන යටතේ තබ්බෝව ව්‍යාපාරයේ තම්බපණ්ණි කොටස මේ සඳහා තෝරා ගෙන ඇති අතර ඒ සඳහා ගෙවතු වගා සංවර්ධනය පලතුරු හා එලවළු වගා සංවර්ධනය සිදු කරනු ලබයි.ඒ අනුව ගෙවතු වගා 10 ක් පූර්ණ සංවර්ධනය කරනු ලබයි. ඒ හරහා බිබිල දොඩම්, මිටි මුරුංගා ,තුඹ කරවිල ලබාදේ.නොමිලේ බීජ පැළ ලබා දේ. ප්‍රතිලාභීන් තෝරා ගැනීම කෘ.ප.නි.ස, ග්‍රාම නිළධාරි,ගොවි සංවිධාන නිළධාරි හා කෘෂි උපදේශක මගින් සිදු කරනු ලබයි.තාක්ෂණික ගම්මාන යටතේ ප්‍රදීපාගම ගම්මානය තෝරා ගෙන ඇත.<br>➢ පාංශු සංරක්ෂණ වැටි සඳහා මුදල් ලබා දේ. | |
| | ශාක රෝග හඳුනා ගැනීම. | සෑම බදාදා දිනකම බෝග සායනයක් ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළ සිදුවේ එහිදි කිසියම් ශාක රෝග ගැටලුවක් සඳහා උපදෙස් ලබා ගත හැක. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| වනාතවිල්ලුව කෘෂිකර්ම උපදේශක | වී වගා කිරීම | අක්කර 02ක බී.ජී.300 බිත්තර වී ගොවිපලක් මයිලන්කුලම තුළ වගාව සිදු කරයි. | |
| | 50% ක දායකත්වය යටතේ බීජ,පැළ හා උපකරණ ලබා දීම හා කාබනික පොහොර ලබා ගැනීම සඳහා මුදල් ලබා දීම. | රටකජු,මුං,මිරිස්,මෑ,බීජ 50% දායකත්වය යටතේ ලබා දීම.පලතුරු මැසි උගුල් 50% දායකත්වය යටතේ ලබා දීමත් කාබනික පොහොර ලබා ගැනීම සඳහා එලවළු ගොවින් සඳහා රු.2000.00 ක මුදලක් ලබා දීම සිදු කරනු ලබයි.ජලය ලබා ගැනීම සඳහා නළ ළිං 02 ක් මයිලන්කුලම ප්‍රදේශයේ ගොවින් සඳහා ලබා දී ඇත. | |

..................................

එල්.පුබුදු නිහාල් ශාන්ත
නේවාසික ව්‍යාපෘති කලමනාකරු(වැ.බ.)
තබ්බෝව ව්‍යාපාරය

එල්. පුබුදු නිහාල් ශාන්ත
නේවාසික ව්‍යාපෘති කළමණාකරු (වැ.බ)
නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය
තබ්බෝව ව්‍යාපාරය
කරුවලගස්වැව

පිටපත්-

01.අධ්‍යක්ෂ ,වාරිමාර්ග කළමනාකරණ අංශය ,කොළඹ
02.දිස්ත්‍රික් ලේකම් ,පුත්තලම
03.අධ්‍යක්ෂ (වත්කම් කළමනාකරණ) ,වාරිමාර්ග දෙපාර්තමේන්තුව,කොළඹ
04.දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ ,පුත්තලම
05.නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ,පුත්තලම
06.ප්‍රාදේශීය ලේකම්, කරුවලගස්වැව/ වනාතවිල්ලුව
07.ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, හලාවත
08.වනජීවි සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ, පුත්තලම
09. වාරිමාර්ග ඉංජිනේරු, පුත්තලම
10.ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරි, පුත්.තබ්බෝව/වනාතවිල්ලුව
11.කෘෂිකර්ම උපදේශක, පුත්.තබ්බෝව/වනාතවිල්ලුව
12.පොල් සංවර්ධන නිළධාරී,පුත්.තබ්බෝව/වනාතවිල්ලුව
13.කජු සංවර්ධන නිළධාරි, පුත්.තබ්බෝව/ වනාතවිල්ලුව
14.තබ්බෝව ව්‍යාපාරයේ සියළුම ගොවි සංවිධාන නියෝජිතයින්
15.ගොනුවට